## ගෙවුම් තුලනය[1]

1979 වර්ෂයේ ගෙවුම් තුලන හැඩගැසීම මූලික වශයෙන් 1977 වර්ෂයේ සිට ඇති වූ ආර්ථික ප්‍රතිසංස්කරනයන්හි ප්‍රතිඵලයක් සේ හැඳින්වියහැක. අපනයන පෙරටු කරගත් ආර්ථික වර්ධනයක් දිගු කාලීනව සපල කර ගැනීමේ බලාපොරොත්තුවෙන් සහ දේශීය ආර්ථික කටයුතු වල ඵලදායිතාවය ඉහල නැංවීමේ අදහසින් ආනයන නිදහස් කරනු ලැබිය. දේශීය ආර්ථික කටයුතු වර්ධනය වීමේ හේතුවෙන් ආනයන සඳහා ඉල්ලුමේ ක්ෂනික වැඩිවීම, සහ ආනයන මිලෙහි තියුණු වැඩිවීමත් නිසා, 1978 දී රුපියල් දශ ලක්ෂ 2,393 (වි ගැ හි දශ ලක්ෂ 144) ක්වූ වෙළඳ හිඟය 1979 දී රුපියල් දශ ලක්ෂ 7,288 (වි ගැ හි දශ ලක්ෂ 362) දක්වා දෙගුණයකටත් වඩා ප්‍රමාණයකින් ඉහළ ගියේය. වර්ෂයේ ගෙවුම් තුලන ස්වභාවය නිශ්චය කිරීමේ මූලික සාධකය වූයේ මෙම විශාල වෙළඳ හිඟයයි.

සේවා ගිණුමේ අතිරික්තය සහ විදේශවලින් ශුද්ධ පැවරීම් සැලකිය යුතු ලෙස වැඩි වූවත්, 1979 දී ජංගම ගිණුමේ රුපියල් දශ ලක්ෂ 3,556 (වි ගැ හි දශ ලක්ෂ 177) ක් වූ මෙතෙක් නොවූ තරම් විශාල හිඟයක් ඇතිවීමට එම ඉහළ වෙළඳ පරතරය හේතුවිය. එසේ වුවත්, විශාල වශයෙන් ලැබුණු දිගු කාලීන ප්‍රාග්ධනය, ජාත්‍යන්තර මුල්‍ය අරමුදලින් (ජා. මු. අ.) ලබාගත් ණය සහ විශේෂ ගැනුම් හිමිකම් අයිතීන් වෙත් කිරීම නිසා ශ්‍රී ලංකාවට ජංගම ගිණුමේ හිඟය පියවීමට හැකිවූවා පමණක් නොව 1979 දී රුපියල් දශ ලක්ෂ 793 (වි ගැ හි දශ ලක්ෂ 35) ක් පමණ වූ සුළු සමස්ථ අතිරික්තයක් ද ජනිත කිරීමට සමත් විය. මෙහි ප්‍රතිඵලය වශයෙන් දළ විදේශ වත්කම් වර්ෂය අවසානයේ දී සියයට 28 කින් රුපියල් දශලක්ෂ 9,652 (වි ගැ හි දශ ලක්ෂ 475) දක්වා වැඩිවූ අතර එම වත්කම් 1980 වර්ෂය සඳහා අපේක්ෂිත ආනයන වලින් මාස 3 1/2 ක ආනයන වියදම් පියවා දැමීමට තරම් ප්‍රමාණවත් විය.

ආනයනගෙවීම් 1979 දී රුපියල් දශ ලක්ෂ 22,570 (වි ගැ හි දශ ලක්ෂ 1,121) දක්වා සියයට 37 කින් තියුණු ලෙස වැඩි වූ අතර ඉකුත් වර්ෂයේ එම වැඩිවීම සියයට 30 ක් විය. 1978 වර්ෂයේ මෙන්ම, ආනයන වියදමේ වැඩිවීම බොහෝ දුරට අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන නිසා සිදුවිය. නව ආයෝජන සඳහා ඇතිවූ දේශීය ඉල්ලුම සපුරාලීමට යන්ත්‍රෝපකරණ, ප්‍රවාහන උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය වැනි ආයෝජන භාණ්ඩ ආනයනය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවිය. අන්තර් භාණ්ඩ සඳහා ආනයන වියදම් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ ඛණිජ තෙල් ආනයන සඳහා වූ ඉහළ මිල සහ අතිකුත් අන්තර් භාණ්ඩ ආනයන ප්‍රමාණය වැඩිවීමය. ඉදිරි වර්ෂ වලදී ආයෝජන භාණ්ඩ ආනයන කෙරෙහි ඇති ඉල්ලුම වේගවත් වීමට ඉඩකඩ ඇත. මේ නිසා නුදුරු අනාගතයෙහි දී සංවර්ධන තැත එසේම පවත්වාගෙන යාම සඳහා තියුණු ලෙස අපනයන පුළුල් කිරීම ඉතාම වැදගත් වනු ඇත.

වි ගැ හි අනුව ගණනය කළවිට 1978 දී රුපියල් දශ ලක්ෂ 13,207 (වි ගැ හි දශ ලක්ෂ 675) ක්වූ අපනයන ඉපයීම් 1979 දී රුපියල් දශ ලක්ෂ 15,282 (වි ගැ හි දශ ලක්ෂ 759) ක් දක්වා සියයට 12 ක මඳ වැඩිවීමක් පෙන්වීය. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන්, සම්ප්‍රදයික අපනයන භෝගයන්ගේ අසතුටුදයක ක්‍රියාකාරීත්වය නිසා සිදුවිය. එසේ වුවද, මසා නිමි කළ ඇඳුම්, රෙදිපිළි සහ ඛණිජ තෙල් නිෂ්පාදන වැනි සම්ප්‍රදායික නොවන අපනයනයන් විශාල වශයෙන් ඉහළ ගියේය. එහෙත් මෙම නිෂ්පාදිතයන්හි යොදු ඇති ආනයන ප්‍රමාණය ඉතා ඉහල බැවින් ඉන් උපයනු ලබන ශුද්ධ විදේශ විනිමය සීමිත වනු ඇත.

---

1. ගෙවුම් තුලනයේ යොදගෙන ඇති දත්තයන් ගෙන් දක්වෙන්නේ වර්ෂය තුල සිදුවූ ලැබීම් හා ගෙවීමය. මෙම දත්තයන් ආනයන සහ අපනයනයන්ගේ ද්‍රව්‍යමය චලනය නිරූපනය කරන මීට ඉහත දක්වූ විදේශීය වෙළඳ දත්තයන්ගෙන් වෙනස්වේ. එම වෙනසට හේතුව නම් එක් අතකින් ලැබීම් හා අනිත් අතින් භාණ්ඩයන්ගේ ද්‍රව්‍යමය චලනයද අතර පවත්නා වෙනසයි.

## 1·21 සංඛ්‍යා සටහන

### ගෙවුම් තුලනය – විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම 1975—1979

| ශීර්ෂ | රුපියල් දශ ලක්ෂ | | | | | විගැහි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1975 | 1976 | 1977 | 1978 | 1979* | 1975 | 1976 | 1977 | 1978 | 1979* |
| 1· වෙළඳ භාණ්ඩ .. | – 1,421 | – 709 | + 350 | – 2,393 | – 7,288 | – 168 | – 73 | + 29 | – 144 | – 362 |
| අපනයන (නැ.වි.ස.) .. | 3,913 | 4,707 | 6,640 | 13,207 | 15,282 | 464 | 484 | 651 | 675 | 759 |
| ආනයන (මි.ර.ගැ.) .. | – 5,334 | – 5,416 | – 6,290 | – 15,600 | – 22,570 | – 632 | – 557 | – 622 | – 819 | – 1,121 |
| 2· සේවා .. | + 89 | + 112 | + 304 | + 119 | + 739 | + 11 | + 12 | + 29 | + 6 | + 37 |
| ලැබීම් .. | 565 | 643 | 923 | 1,942 | 2,991 | 67 | 66 | 89 | 99 | 149 |
| ගෙවීම් .. | 476 | 531 | 619 | 1,823 | 2,253 | 56 | 54 | 60 | 93 | 112 |
| 3· භාණ්ඩ හා සේවා (1+2) .. | – 1,332 | – 597 | + 654 | – 2,274 | – 6,549 | – 157 | – 61 | + 58 | – 138 | – 325 |
| 4· සංක්‍රාම .. | 560 | 547 | 612 | 1,242 | 2,993 | 66 | 56 | 59 | 63 | 148 |
| පෞද්ගලික .. | 19 | 56 | 122 | 342 | 754 | 2 | 6 | 12 | 17 | 37 |
| නිල .. | 541 | 491 | 490 | 900 | 2,239 | 64 | 50 | 47 | 46 | 111 |
| 5· ජංගම ගිණුම් ශේෂය .. | – 772 | – 50 | + 1,266 | – 1,032 | – 3,556 | – 91 | – 5 | + 117 | – 75 | – 177 |
| 6· මූල්‍ය නොවන ප්‍රාග්ධන .. | 404 | 591 | 326 | 2,600 | 3,306 | 48 | 61 | 32 | 133 | 164 |
| පෞද්ගලික අංශය .. | – 32 | – 109 | – 127 | 145 | 874 | – 4 | – 11 | – 12 | 8 | 43 |
| රාජ්‍ය අංශය .. | 436 | 700 | 453 | 2,455 | 2,432 | 52 | 72 | 44 | 125 | 121 |
| දිගුකාලීන (ශුද්ධ) .. | 560 | 659 | 602 | 2,609 | 2,432 | 67 | 68 | 58 | 133 | 121 |
| ලැබීම් .. | (1,254) | (1,244) | (1,319) | (3,680) | (3,351) | (149) | (128) | (127) | (188) | (167) |
| ගෙවීම් .. | (– 694) | (–585) | (–717) | (–1,071) | (–919) | (–82) | (–60) | (–69) | (–55) | (–46) |
| කෙටි කාලීන (ශුද්ධ) .. | – 124 | 41 | – 149 | – 154 | — | – 15 | 4 | – 14 | – 8 | — |
| 7· රුපියල් අගය පිළිබඳ ගැලපීම් .. | — | — | 1,680 | 344 | – 18 | — | — | — | — | — |
| 8· වැරදීම් සහ අත්හැරීම් .. | – 32 | – 10 | + 41 | – 50 | + 820 | – 8 | – 7 | 4 | 7 | 36 |
| 9· විගැහි ලැබීම් .. | — | — | — | — | 241 | — | — | — | — | 12 |
| 10· සමස්ථ ශේෂය .. | – 400 | 531 | 3,313 | 1,861 | 793 | – 51 | 49 | 153 | 65 | 35 |
| 11· මූල්‍ය වෙනස්වීම් (–අතිරික්තය) .. | + 400 | – 531 | – 3,313 | – 1,861 | – 793 | 51 | – 49 | – 153 | – 65 | – 35 |
| ශ්‍රී ලංකා රුපියල්-විගැහි (වාර්ෂික සාමාන්‍යය) පරිවර්ත්‍ය කිරීමේ අනුපාතිකය .. | | | | | | 8·44 | 9·73 | 10·42 | 19·58 | 20·13 |

• තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන: 1· ඉකුත් වාර්තාවන් හි ගෙවුම් තුලනය පිළිබඳ සංඛ්‍යා සටහන් වෙනුවට, 1975 සිට මෙම විශ්ලේෂණාත්මක සංඛ්‍යා සටහන ඉදිරිපත් කර ඇත.

2· මූල්‍ය අංශයේ සියළු ගනු දෙනු සඳහා පරිවර්ත්‍ය කිරීමේ අනුපාතිකය ලෙස වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය යොදා පරිවර්ත්‍ය කොට ඇත. මූල්‍ය වෙනස්වීම් කාලච්ඡේදය අවසානයේ අනුපාතිකය අනුව පරිවර්ත්‍ය කොට ඇත. 1977 සිට ඉදිරියට සේවා අංශයේ සහ මූල්‍ය නොවන අංශයේ සියළුම ගනු දෙනුවල පරිවර්තිකයන් කාර්තු හතරේ පරිවර්තිකයන්ගේ එකතුව නියෝජනය කරන අතර, එය වාර්ෂික සාමාන්‍ය පරිවර්ත්‍ය අනුපාතිකයට සමාන විය යුතු නොවේ.

එනිසා ටික කලක් යනතුරු විදේශ විනිමය උපයන ප්‍රධාන මාර්ගය ලෙස තවදුරටත් සම්ප්‍රදායික අපනයන භෝගමත රැඳී සිටීමට ශ්‍රී ලංකාවට සිදුවනු ඇත.

කලින් වර්ෂයේ දී රුපියල් දශ ලක්‍ෂ 119 (වි ගැ හි දශ ලක්ෂ 6) දක්වා අඩුවූ සේව ගිණුමේ අතිරික්තය, 1979 වසරේදී රුපියල් දශ ලක්ෂ 739 (වි ගැ හි දශ ලක්ෂ 37) දක්ව සීඝ්‍රයෙන් ඉහළ නැගුනි. මෑත වර්ෂවලදී මෙන්ම මෙම ගිණුමේ අතිරික්තයක් ඇති කිරීමට මූලික වශයෙන් හේතුවූයේ සංචාරක ව්‍යාපාරයයි. සංචාරකයින් පැමිණීම සියයට 30 කින් පමණ වැඩිවීම සංචාරක ව්‍යාපාරයේ දළ ඉපයීම් සියයට 40 කින් පමණ, එනම් 1978 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 750 (වි ගැ හි දශ ලක්ෂ 38) සිට 1979 වර්ෂයේ රුපියල් දශ දශලක්ෂ 1,053 (වි ගැ හි දශ ලක්ෂ 53) දක්වා වැඩිවීමට එක් හේතුවක් විය. ඉකුත් වර්‍ෂයේ තියුනු වැඩිවීම සමග සසඳා බලන කල, 1979 වසරේදී එතෙර සංචාර සඳහා කළ වියදම රුපියල් දශ ලක්ෂ 458 (වි ගැ හි දශ ලක්ෂ 23) දක්වා ඉතා සුළු වශයෙන් වැඩිවිය. විදේශ ආයෝජන, පොළී ඉපයීම් හා වරාය සේවා ඉපැයීම්වල වර්ධනයද සේවා ගිණුමේ අතිරික්තයට හේතු විය. විදේශ වත්කම් වර්ධනයත් සමග එම වත්කම් විදේශීය මුදල් වෙළඳ පොලවල ආයෝජනය කිරීමෙන්, ආයෝජන පොළී ඉපයීම් 1978 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 314 (වි ගැ හි දශ ලක්ෂ 16) සිට 1979 රුපියල් දශ ලක්ෂ 614 (වි ගැ හි දශ ලක්ෂ 30) දක්වා ආසන්න වශයෙන් දෙගුණයක් විය. අනෙක් අතට විදේශ ණය සඳහා පොළී ගෙවීම්, රුපියල් දශ ලක්ෂ 458 (වි ගැ හි දශ ලක්ෂ 25) සිට රුපියල් දශ ලක්‍ෂ 756 (වි ගැ හි දශ ලක්ෂ 37) දක්වා හෙවත් සියයට 48 කින් වැඩිවිය.

1979 වර්‍ෂයේ ඇතිවූ තවත් සැලකිය යුතු ප්‍රගතියක් නම් ශ්‍රී ලංකාවට ලැබුන ශුද්ධ සංක්‍රාම-යන්ගේ වැඩිවීමයි. නිල හා පෞද්ගලික සංක්‍රාම දෙවර්ගයම වැඩිවීම නිසා 1978 රුපියල් දශ ලක්ෂ 1,242 (වි ගැ හි දශ ලක්ෂ 63) සිට 1979 රුපියල් දශ ලක්ෂ 2,993 (වි ගැ හි දශ ලක්ෂ 148) දක්වා මුළු ශුද්ධ සංක්‍රාම දෙගුණයකට වැඩි ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. පෞද්ගලික සංක්‍රාම වලින් වැඩි කොටසක් එතෙර සේවය කරන ලාංකිකයන් විසින් එවන ලද මුදල් වලින් සමන්විත විය. එවැනි සංක්‍රාම, කලින් වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 610 (වි ගැ හි දශ ලක්ෂ 31) සිට රුපියල් දශ ලක්ෂ 935 (වි ගැ හි දශ ලක්ෂ 46) දක්වා සියයට 48 කින් වැඩි වී ඇතැයි ගණන් බලා ඇත. දළ වශයෙන් මෙයින් සියයට 70 පමණ මැද පෙරදිග රටවල සේවයේ නියුතු ශ්‍රී ලංකිකයින් විසින් එවන ලද මුදල් වලින් සමන්විත වන්නට ඇතැයි ඇස්ත-මේන්තු කළ හැකිය. විදේශීය ආණ්ඩු හා ජාත්‍යන්තර සංවිධාන වලින් ප්‍රදානය කෙරුණු යෝජනා ක්‍රම හා ද්‍රව්‍යාධාර වැඩි කොටසකින් සමන්විත නිල සංක්‍රාම, 1978 දී රුපියල් දශ ලක්ෂ 900 (වි ගැ හි දශ ලක්ෂ 46) සිට 1979 දී රුපියල් දශ ලක්ෂ 2,239 (වි ගැ හි දශ ලක්ෂ 111) දක්වා දෙගුණයකටත් වඩා වැඩිවිය.

විදේශ සම්පත් උපයෝගී කළ අයුරු 1·22 සංඛ්‍යා සටහනේ දක්වා ඇත. වි ගැ හි වලින් ගණනය කළ විට, සමස්ථ විදේශ ගෙවීම් (වැය කිරීම්) සියයට 28 කින් ඉහළ ගිය අතර, විදේශ ඉපැයීම් වැඩිවූයේ (මූලාග්‍ර) සියයට 18 කින් පමණකි. එහි ප්‍රතිඵලයක් ලෙස විදේශ සම්පත් පරතරය, 1978 රුපියල් දශ ලක්ෂ 4,048 (වි ගැ හි දශ ලක්ෂ 230) සිට 1979 රුපියල් දශ ලක්ෂ 7,554 (වි ගැ හි දශ ලක්ෂ 376) දක්වා පුළුල් විය. ඉහත පෙන්වා දුන් පරිදි, ඉහළ මට්ටමක වූ ආනයන ගෙවීම් සම්පත් පරතරය පුළුල් වීමට හේතුවූ ප්‍රධාන සාධකය විය. 1977 වර්ෂයට පෙර මුළු ගෙවීම්හි විශාල ප්‍රතිශතයක් ලෙස පැවති ප්‍රාග්ධන ගෙවීම්, 1979 වර්ෂයේදී තවදුරටත් පහත වැටීම, විදේශ සම්පත් පරතරය පියවීම පිළිබඳ මෑත වර්ෂවල අනුගමනය කළ වැදගත් වෙනස්කම් පිළිබිඹු කරන්නකි.

# ගෙවුම් තුලනය

වාර්ෂිකව




(වි හැ අ = වි ගැ හි)

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

# විදේශ වත්කම්

ත්‍රෛමාසිකව




(විහැඅ = විශැති)

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1·22 වැනි සංඛ්‍යා සටහන

### විදේශ සම්පත් පරතරය පියවීම 1977 – 1979

| ශීර්ෂ | රුපියල් දශලක්ෂ | | | වි ගැ හි දශ ලක්ෂ | | |
|---|---|---|---|---|---|---|
| | 1977 | 1978 | 1979 | 1977 | 1978 | 1979 |
| 1· විදේශීය ඉපැයීම .. | 7,753 | 15,759 | 19,210 | 758 | 805 | 954 |
| 1·1 අපනයන .. | 6,640 | 13,207 | 15,282 | 651 | 675 | 759 |
| 1·2 සේවා .. | 923 | 1,942 | 2,993 | 89 | 99 | 149 |
| 1·3 පෞද්ගලික සංක්‍රාම .. | 190 | 610 | 935 | 18 | 31 | 46 |
| 2· විදේශීය ගෙවීම් .. | 8,613 | 19,807 | 26,764 | 845 | 1,035 | 1,330 |
| 2·1 ආනයන .. | 6,290 | 15,600 | 22,570 | 622 | 819 | 1,121 |
| 2·2 සේවා .. | 620 | 1,823 | 2,253 | 60 | 93 | 112 |
| 2·3 පෞද්ගලික සංක්‍රාම .. | 67 | 268 | 181 | 6 | 14 | 9 |
| 2·4 ප්‍රාග්ධන ආපසු ගෙවීම් | 1,636 | 2,116 | 1,760 | 157 | 109 | 88 |
| 3· විදේශ සම්පත් පරතරය .. | – 860 | –4,048 | –7,554 | – 87 | – 230 | – 376 |
| 4· සම්පත් පරතරය පියවීම .. | + 860 | +4,048 | +7,554 | + 87 | + 230 | + 376 |
| 4·1 දිගුකාලීන ණය1 .. | 1,184 | 3,680 | 2,903 | 114 | 188 | 144 |
| 4·2 ත්‍යාග ප්‍රදානයන් .. | 490 | 900 | 2,239 | 47 | 46 | 111 |
| 4·3 සැපයුම්කරුවන්ගේ ණය | 135 | 8 | 609 | 13 | — | 31 |
| 4·4 කෙටිකාලීන ණය .. | 225 | 114 | 41 | 22 | 6 | 2 |
| 4·5 බැංකු ණය ගැනීම් | 222 | — | — | — | — | — |
| 4·6 ද්විපාර්ශ්විකශේෂයන් | — | — | 413 | — | — | 20 |
| 4·7 ජා මූ අ ණය ගැනීම් | 935 | 756 | 1,592 | 55 | 38 | 80 |
| 4·8 ඍජු ආයෝජන .. | 4 | 23 | 769 | — | 1 | 38 |
| 4·9 විදේශ වත්කම් .. | –4,171 | –1,904 | –2,175 | – 169 | – 65 | – 104 |
| 4·10 වි ගැ හි වෙන් කිරීම් | — | — | 241 | — | — | 12 |
| 4·11 වෙනත් .. | 115 | 177 | 120 | 11 | 9 | 6 |
| 5· රුපියල් අගය පිළිබඳ ගැලපීම්2 .. | 1,680 | 344 | – 18 | — | — | — |
| 6· වැරදීම් හා අත්හැරීම් .. | + 41 | – 51 | + 820 | — 6 | + 7 | + 36 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1· යෝජනා ක්‍රම ආධාර, ද්‍රව්‍ය ආධාර සහ භාරකාර අරමුදලින් කළ ගැනුම්.

2· විනිමය අනුපාතිකයේ වෙනස්කම් නිසා ගණන් බලන ලද වැඩිවූ විදේශ වත්කම්වල අගය.

1977 සිට විදේශ සම්පත් පරතරය පියවීමේ දී කෙටිකාලීන ණය සහ බැංකු ණය වලට වඩා ප්‍රදානයන්, දිගුකාලීන ණය, පෞද්ගලික ඍජු ආයෝජන සහ ජා. මූ. අ. කරන ලද ගැනුම් වැඩි වැදගත් කමක් ගෙන ඇත. දිගුකාලීන ණය ලැබීම්, ද්‍රව්‍යාධාර වශයෙන් රුපියල් දශ ලක්ෂ 1,464 (වි ගැ හි දශ ලක්ෂ 72) ක්ද, යෝජනා ක්‍රම ආධාර වශයෙන් රුපියල් දශ ලක්ෂ 840 (වි ගැ හි දශ ලක්ෂ 42) ක් සහ ජා. මූ. අ. භාරකාර අරමුදලින් ලත් ණය රුපියල් දශ ලක්ෂ 599 (වි ගැ හි දශ ලක්ෂ 30) කින්ද සමන්විත විය. දිගුකාලීන ණය ලැබීම් 1978 දී රුපියල් දශ ලක්ෂ 3,680 (වි. ගැ. හි. දශ ලක්ෂ 188) සිට 1979 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 2,903 (වි ගැ හි දශ ලක්ෂ 144) දක්වා පහත වැටුන නමුත්, ලැබුනු ප්‍රදානයන් සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවීම් නිසා එම පහත වැටීම පමණටත් වඩා සමහන් විය. ඒ අනුව විදේශ සම්පත් පරතරය පියවීමේදී ප්‍රදානයන්හි වැදගත්කම සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඊට ද්‍රව්‍යමය දීමනා රුපියල් දශ ලක්ෂ 1,167 වි ගැ හි දශ ලක්ෂ 58) ක්ද, යෝජනා ක්‍රම දීමනා රුපියල් දශ ලක්ෂ998 (වි ගැ හි දශ ලක්ෂ 49) ක්ද, ජා. මූ. අරමුදලේ රන් අලෙවි කිරීමේ වැඩ පිළිවෙල යටතේ ලාභ බෙදීම් මගින් ලැබුනු රුපියල් දශ ලක්ෂ 74 (වි ගැ හි දශ ලක්ෂ 4) ක්ව විය. 1978 දී ඉතා තියුණු ලෙස පහත වැටුනු සැපයුම් කරුවන්ගේ ණය 1979 දී රුපියල් දශ ලක්ෂ 609 (වි ගැ හි දශ ලක්ෂ 31) දක්වා සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ නැගිනි.

මූල්‍ය නොවන ප්‍රාග්ධන අංශයන්හි කැපී පෙනෙන අනිත් ලක්ෂණය වූයේ මහ කොළඹ ආර්ථික කොමිසමට (ම. කො. ආ. කො.) අයත් ආයෝජන වර්ධන කලාපයේ ආයෝජන ලෙස ශුද්ධ වශයෙන් ලැබුන පෞද්ගලික විදේශ ප්‍රාග්ධනය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවීමයි. 1978 රුපියල් දශ ලක්ෂ 20 (වි ගැ හි දශ ලක්ෂ 1) වූ පෞද්ගලික අංශයේ ඍජු ආයෝජන 1979 දී රුපියල් දශ ලක්ෂ 769 (වි ගැ හි දශ ලක්ෂ 38) දක්වා වර්ධනය විය.

1977 සිට ජා. මු. අ. මගින් කළ ගැනුම් ද ඉතා තියුණු ලෙස වර්ධනය විය. දික් කළ ගැනුම් පහසුකම් (දි ගැ ප) යටතේ 1979 වර්ෂයේ දී ජා. මු. අ. මගින් රුපියල් දශ ලක්ෂ 1,592 (වි ගැ හි දශ ලක්ෂ 80) සමාන වාරික දෙකකින් සපයන ලදී. ආර්ථිකයේ ව්‍යුහමය වෙනස් කිරීම ඉටු කිරීම සඳහා අවශ්‍ය මධ්‍ය කාලීන ගෙවුම් තුලන ආධාර සැපයීම පිණිස, කාලීන සාකච්ඡා පැවැත්වීමෙ සහ ශ්‍රී ලංකාවේ සමස්ථ ආර්ථික ප්‍රතිපත්ති කෙරෙහි අන්‍යොන්‍ය එකඟත්වයක් පැවැත්වීමේ කොන්දේසියට යටත්ව 1979 ජනවාරි මස ශ්‍රී ලංකාව සඳහා අනුමත වූ දි ගැ ප වැඩ පිළිවෙල යටතේ වි ගැ හි දශ ලක්ෂ 260·3 (රුපියල් දශ ලක්ෂ 5,206) කට ආසන්න මුදලක් 1979 සිට 1981 වර්ෂ දක්වා 3 ක කාලයක් තුලදී ශ්‍රී ලංකාවට ලබා ගැනීමට අවසර ලැබුණි. ඊට අමතරව 1979 ජනවාරි මාසයේදී ජා. මු. අ. විසින් වි ගැ හි දශ ලක්ෂ 12·4 ක් (රුපියල් දශ ලක්ෂ 241 කට ආසන්න) ශ්‍රී ලංකාවට වෙන් කරන ලදී. 1978 දෙසැම්බර් මස ජා. මු. අ. විසින් අනුමත කල යෝජනාව යටතේ කරන ලද ප්‍රථම වි ගැ හි වෙන් කිරීම මෙය වූ අතර 1979, 1980 සහ 1981 යන සෑම වර්ෂයකදීම ජා. මු. අරමුදලෙහි වි ගැ හි දෙපාර්තමේන්තුවේ සියළුම සහභාගි වුවන් සඳහා වි ගැ හි දශලක්ෂ 4,000 ක් පමණ වූ මුළු වෙන් කිරීම් එකතුවක් එමගින් සපයන ලදී.

ප්‍රාග්ධන ගිණුමෙහි අතිරික්තයක් ඇති කිරීම වස්, රාජ්‍ය අංශයට ලැබූ දිගුකාලීන ණය, ජා. මු. අ. ගැණුම්, පෞද්ගලික ඍජු ආයෝජන සහ වි ගැ හි වෙන් කිරීම හේතු විය. ජංගම ගිණුමෙහි හිඟය පියවීමට සහ විදේශීය සම්පත් පරතරය පියවීමට මෙම අතිරික්තය ඕනෑවටත් වඩා ප්‍රමාණවත් වූ අතර ඉතිරි වූ අතිරේක සම්පත් ප්‍රමාණය විදේශ වත්කම් වලට එකතු විය.

පසුගිය වර්ෂ 3 තුලදී ශ්‍රී ලංකාවේ විදේශ වත්කම් වල ඇතිවූ සැලකිය යුතු දියුණුව නිසා ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳ පොළවලින් රටට ණය ලබා ගැනීමට ඇති හැකියාව වඩාත් ශක්තිමත් විය. ජූනි මසදී රජය විසින් පළමු වර්ෂ 4 තුල වර්ෂයකට ලිබෝර් (ලන්ඩන්හි අන්තර් බැංකු ඉදිරිපත් කරන අනුපාතිකය) වලට වඩා සියයට එකකින් 7/8 ක සහ ඉන්පසුව ලිබෝර් වලට වඩා සියයට එකක් වූ වාසි සහගත කොන්දේසි යටතේ වර්ෂ 8ක් සඳහා වූ එ ජ ඩොලර් දශ ලක්ෂ 50 (රු. ද. ල. 781) ක යුරෝ ඩොලර් ණයක් ලබා ගැනීම සඳහා ගිවිස ගන්නා ලදී. කෙසේ වෙතත් රටෙහි වත්කම් තත්ත්වයෙහි පැවති ශක්තිමත් භාවය නිසා 1979 වර්ෂයේදී මෙම ණය මුදල ලබා නොගන්නා ලදී.

ණය සේවා අනුපාතිකය (එනම් වෙළඳ භාණ්ඩ අපනයනයන් හා සේවාවන්ගෙන් වන ඉපැයීම්, ජා. මු. අ. සමග කරන ගනුදෙනු හා බැංකු ණය ඇතුලු විදේශ ණය සඳහා කරනු ලබන ප්‍රාග්ධන ආපසු ගෙවීම් සහ පොළී ගෙවීම් වල ප්‍රතිශතයක් ලෙස ගණනය කිරීම) 1978 දි සියයට 15 සිට 1979 දී සියයට 13 ක් දක්වා පහත වැටීමට එක් හේතුවක් වූයේ විදේශ සම්පත් පරතරය පියවීමේ ලා මෑත වර්ෂ වලදී අනුගමනය කළ ක්‍රම වල ඇති වූ වෙනස් වීමය. ජා. මු. අ. සමග ගනුදෙනු අත්හල විට ණය සේවා අනුපාතය 1978 දී සියයට 12 සිට 1979 දී සියයට 8 දක්වා පහත වැටුනි. මෑත අතීතයේදී එළඹෙන ලද ණය ගිවිසුම් වල කල්පිරීම් ව්‍යුහයේ ඇති වෙනස්වීම් නිසා නියත වශයෙන් ගෙවූ ණය සේවා 1978 දී රුපියල් දශලක්ෂ 1,862 (වි ගැ හි දශලක්ෂ 95) සිට 1979 දී රුපියල් දශලක්ෂ 1,620 ක් (වි ගැ හි දශ ලක්ෂ 80) දක්වා සියයට 16 කින් පහත වැටුනි. ණය සේවා බර ලිහිල් වීම එක් අතකින් 1979 අපනයන සහ සේවා ඉපයීම් වැඩිවීම සහ අනිත් අතින් මෑත කාලයේ කරන ලද ණය ගැනීම් ඉතා වාසිදායක කොන්දේසි මත සිදු කිරීම නිසා වූ බව පැහැදිලි කළ හැකිය. නිදසුන් වශයෙන් 1979 ගිවිසගත් මුළු දිගු කාලීන ණය වලින් සියයට 70 පමණ එනම් ණය වල මුළු වටිනාකම අනුව සියයට 74 ක් පමණ, වර්ෂ 10 ක් හෝ ඊට වැඩි සහන කාල

## විනිමය අනුපාතික

1977 නොවැම්බර් 16 දින සිට සමුච්චිත ප්‍රතිශත වෙනස්වීම




(වි.හැ.අ. = විශැහි)

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

පරිච්ඡේදයක් මත පදනම් වූ ඒවා බව සඳහන් කළ හැකිය. යෝජනා ක්‍රම සහ ද්‍රව්‍යමය ණය දැඩි සේ උපයෝගී කර ගැනීමෙන් සහ දිගැප සහ භාරකාර අරමුදල් ක්‍රම යටතේ ජා. මූ අ. කල ගැණුම් වල ප්‍රතිඵලයක් වශයෙන් 1978 අවසානයේදී පැවති රුපියල් දශ ලක්ෂ 17,506 (වි ගැ හි දශලක්ෂ 865) ක ඉතිරි වී ඇති විදේශ ණය ප්‍රමාණය 1979 අවසානය වනවිට රුපියල් දශලක්ෂ 18,447 (වි ගැ හි දශලක්ෂ 906) දක්වා ඉහළ නැගීන.

1977 නොවැම්බර් මස 16 වැනි දින, එනම් ශ්‍රී ලංකා රුපියල පාවීමට ඉඩහල දින සිට විනිමය අනුපාත වල සමුච්චිත වෙනස්වීම් අනුව, 1979 අවසානයේදී රුපියලෙහි අගය ඇ. එ. ජ. ඩොලරයට ප්‍රතිමුඛව සියයට 4 ක සහ ජපන් යෙන් වලට ප්‍රතිමුඛව සියයට 1 ක වැඩිවීමක් පෙන්නුම කරන ලදි. අනිත් අතින් රන් පවුමට ප්‍රතිමුඛව සියයට 16 කින් හා ඩොයිෂ් මාර්ක් වලට ප්‍රතිමුඛව සියයට 21 කින් සහ විශේෂ ගැණුම් හිමිකම් වලට (වි ගැ හි) ප්‍රතිමුඛව සියයට 7 කින්ද රුපියලේ පිරිහීමක් දක්නට ලැබුනි.

## රජයේ මුදල් පරිහරණය

1979 වසරේ රජයේ ආදයම හා වියදමට අදල තාවකාලික දත්ත අනුව වර්තන ගිණුමේ රුපියල් දශ ලක්ෂ 200 ක අතිරික්තයක් දක්නට ලැබේ. මේ වනාහි මුල් ඇස්තමේන්තුවල අතිරික්තය වූ රුපියල් දශ ලක්ෂ 895 ක මුදලට බෙහෙවින් ප්‍රතිවිරුද්ධ වූවකි වර්තන ගිණුම මෙ ලෙස පිරිහීමට ප්‍රධාන වශයෙන් ම හේතුසාධක වූයේ, පුනරාවර්තන වියදම් වැඩි වීමත්, අත්තිකාරම් ගිණුම් යටතේ ගෙවීම් බොහෝ සේ ඌන තක්සේරුවකට භාජන වීමත් යන කරුණු ය. නිදන් අරමුදලේ දායක මුදල් හා ආපසු ගෙවීම් ද ඇතුළුව, තාවකාලික ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 8,991 ක් විය. වර්තන ගිණුමේ රුපියල් දශ ලක්ෂ 200 ක අතිරික්තයක් තිබියදී, සමස්ත අයවැය පරතරය රුපියල් දශ ලක්ෂ 8,791ක් විය. මෙම පරතරය පියවීම සඳහා බෙහෙවින් ම ඉවහල් කර ගන්නා ලද්දේ දේශීය සම්පත්වලින් ලබාගත් රුපියල් දශ ලක්ෂ 4,589 ක මුදල හා විදේශීය ප්‍රභවයන්ගෙන් ලබා ගත් රුපියල් දශ ලක්ෂ 4229 ක් වූ මුදලය. රජයේ මුදල් පරිහරණයේ අවසාන ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශ ලක්ෂ 634කි.

1979 වසරේ රජයේ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 21,521 කි. මෙය පසුගිය වසරේ මුළු වියදම වන රුපියල් දශ ලක්ෂ 18,853 හා සසඳන විට, සියයට 14 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. අත්තිකාරම් ගිණුම් යටතේ වියදම් ද ඇතුළත් වූ විට පුනරාවර්තන වියදම රුපියල් දශ ලක්ෂ 12,530 ක් වූ අතර, ඉතිරි රුපියල් දශ ලක්ෂ 8,991 ක මුදල ප්‍රාග්ධන වියදම් විය. කලින් වසර හා සසඳන විට පුනරාවර්තන වියදම සියයට 2 කින් වැඩි වූ අතර, ප්‍රාග්ධන වියදම සියයට 36 කින් ඉහළ ගියේ ය. කෙසේ වුව ද දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ගත් කල, රජයේ මුළු වියදම සියයට 49 සිට සියයට 42 දක්වා පහත වැටුණි. දළ ජාතික නිෂ්පාදිතයේ පුනරාවර්තන වියදමට අයත් කොටස, සියයට 32 සිට 25 දක්වා පහත වැටුණු අතර ප්‍රාග්ධන වියදම සියයට 17 සිට 18 දක්වා වැඩි විය. රජයේ ආදයම 1978 වසරේ පැවැති රුපියල් දශ ලක්ෂ 11,688 සිට 1979 වසරේ දී රුපියල් දශ ලක්ෂ 12,730 දක්වා සියයට 9 කින් වැඩි විය. කෙසේ වුව ද, දළ ජාතික නිෂ්පාදිතයට අදල ආදයමට අයත් අනුපාතය සියයට 30 සිට සියයට 25 දක්වා අඩු විය.

1979 වසර සඳහා මුදල් ගනුදෙනුවල සාරාංශය හා 1980 වසර සඳහා අනුමත කරන ලද ඇස්තමේන්තු, අංක 1·23 දරන සංඛ්‍යා සටහනේ දක්වා ඇත. 1979 වසර සඳහා රජයේ මුදල් ගනුදෙනුවල ශුද්ධ මූල්‍ය පරතරය, පසුගිය දස වසර වෙනුවෙන් සන්සන්දනාත්මක දත්ත ද සමග, සංඛ්‍යා ලේඛන පරිශිෂ්ඨයේ 22 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

### ආදයම

තාවකාලික දත්ත අනුව, 1979 වසරේ රජයේ ආදයම රුපියල් දශ ලක්ෂ 12,730ක් වූ අතර මෙය ඊට කලින් වසරේ රුපියල් දශ ලක්ෂ 11,688 ක් වූ ආදයමට වඩා සියයට 9 ක වැඩිවීමක් වාර්තා කරයි. 1979 වසරේ මුළු ආදයමෙන් සියයට 77 ක් පමණ උපයා ගන්නා ලද්දේ, නිෂ්පාදන හා වියදම් මත වූ වක්‍ර බදුවලිනි. මෙය පසුගිය වසරේ පැවැති සියයට 79 ට වඩා මදක් අඩු ය.